# <u>ලෙබනන් රාජ්‍යයේ ප්‍රථම ශ්‍රී ලංකා තානාපතිනිය අක්තපත්‍ර ප්‍රදානය කිරීම</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ලෙබනනයේ නව තානාපතිනිය වශයෙන් රිතිශ්‍රී රක්තියා කුමාරි විජේරත්න මෙන්ඩිස් මැතිණිය ලෙබනන් ජනාධිපති නිළ නිවසේදී (බාබ්දා මන්දිරිය) නව ජනාධිපති ජෙනරාල් මිෂෙල් අවුන් මැතිතුමා වෙත 2016 නොවැම්බර 16 වන දින තම අක්තපත්‍ර ප්‍රදානයකරන ලදී. එතුමිය ශ්‍රී ලංකා රජය විසින් මැදපෙරදිග රාජ්‍යයක් වෙත පත්කරන ලද ප්‍රථම තානාපතිවරියයි.



ගරු තානාපතිතුමිය හමුදා උත්තමාචාර පිළිගනිමින්

මෙම අවස්ථාවට එරට ආගමන හා විදේශකටයුතු අමාත්‍ය ජිබ්රාන් බැසිල් විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් තානාපති වෆික් රහිම්, ජනාධිපති මන්දිරයේ සංධාන අංශයේ අධ්‍යක්ෂ ජනරාල් ලාහුඩ් ලාහුඩ්, විදේශකටයුතු අමාත්‍යාංශයේ සංධාන අධ්‍යක්ෂ - තානාපතිනිය මීරා දාහාර්, යන රාජ්‍ය නිළධාරීන් මෙම අවස්ථාවට සහභාගි වූ අතර ලෙබනනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ තානාපති නිළධාරීන් වන උපදේශක (කම්කරු සහ සුභසාධක) - දීපාල් ප්‍රේමරත්න මහතා, උපදේශක (කම්කරු) - කුමාරි ජයරත්න මහත්මිය, පරිවාරක - ශ්‍රියානි පතිරණ මහත්මිය මෙම අවස්ථාවට සහභාගි විය.



ගරු තානාපතිතුමිය ගරු ජනාධිපතිතුමාවෙත තම
අක්තපත්‍ර ප්‍රදානයකරමින්

අක්ත පත්‍ර ප්‍රදානය කිරීමෙන් අනතුරුව ජනාධිපතිතුමා සහ ගරු තානාපතිතුමිය සුහද පිළිසඳරක යෙදුන අතර මිෂෙල් අවුන් මහතා විසින් ලෙබනනයේ ආර්ථික ප්‍රවර්ධනය සඳහා ශ්‍රී ලාංකික විගමනික ප්‍රජාවගේ දායකත්වය ඇගයීමට ලක්කරන ලද අතර දෙරට අතර සුහදතා වර්ධනය සඳහා අවශ්‍ය නොමසුරු දායකත්වය ලෙබනන් රාජ්‍ය මගින් ලබා දෙන බවට එකඟතාවය පල කරන ලදී. පිළිතුරු වශයෙන් තානාපතිතුමිය ශ්‍රී ලංකා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිඳුන්ගේ සහ අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ උණුසම් සුභාශිංෂනය ලෙබනනයේ ජනාධිපතිතුමාට හා ලෙබනනයේ ජනතාව වෙත පුදකරන ලදී. එම අවස්ථාවේදී එරට තානාපති සම්ප්‍රදායට අනුව යමින් මිෂෙල් අවුන් මහතා විසීන් දෙරටඅතර මිත්‍ර සබඳතාවය වෙනුවෙන් සව්දිය පුරන ලදී. ඒ සඳහා ස්තුති පූර්වකවෙමින් තානාපතිතුමිය විසින් තම ධූරකාලය තුලදී අන්‍යොන්‍ය මිත්‍රත්ව සහ සහයෝගතාව මත පදනම් වූ ද්විපාර්ශ්වික සම්බන්ධතාවය වැඩිදියුණු කරගැනීම තම අභිමථාර්තය බව පළකරන ලදී.



තානාපතිතුමිය සහ තානාපති නිලධාරින් ගරු ජනාධිපතිතුමන් සමග
සුහද පිළිසඳරක

විජේරත්න මෙන්ඩිස් මැතිණිය කුරුණෑගල ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමයේ සහ මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ ආදි ශිෂ්‍යාවකි. එතුමිය කොළඹ විශ්ව විද්‍යාලයේ උපාධිධාරිනියක වන අතර 1989 වසරේදි බණ්ඩාරනායක ජාත්‍යන්තර අධ්‍යයන ආයතනයෙන් ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබද ඩිප්ලෝමා පාඨමාලාවද ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබද පශ්චාත් උපාධිය වියානා ජාත්‍යන්තර ඇකඩමියෙන් ද ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබද විශේෂ උපාධිය වියානා විශ්වවිද්‍යාලයෙන් ලබා ඇත. එමෙන්ම ජර්මානු ආර්ථික සංවර්ධන සහයෝගිතා අමාත්‍යාංශය මගින් පවත්වනු ලැබූ තානාපතිපරිචය පිළබඳ වෘත්තීය පුහුණු පාඨමාලාව හදාරා ඇත. එක්සත් ජාතින්ගේ පුහුණු හා පර්යේෂණ ආයතනය මගින් ප්‍රදානය කරන ලද ජාත්‍යන්තර සාමය ආරක්ෂාකිරීම හා ගැටුම් වැළක්වීම පිළිබඳ සහතිකයද ලබා ඇත.

එතුමිය තම ශාස්ත්‍රීයකටයුතු වලට අමතරව පාසැල් ජිවිතයේදි සහ විශ්වවිද්‍යාල ජිවිතයේදි විෂය පරිභාහිර දක්ෂතා දක්වූ අතර 1982 වසරේ මහමායා බාලිකා විද්‍යාලිය දැල් පන්දු සහ පැසිපන්දු වර්ණ සහ විද්‍යාලිය දක්ෂතම ක්‍රීඩිකාවට හිමි සම්මානයද ලබාගන්නා ලදි. තවද මධ්‍යමපලාත නියෝජනය කරමින් 1984 වර්ෂයේදි ශ්‍රී ලංකා කාන්තා පැසිපන්දු කණ්ඩායමට තේරිපත්වූ අතර 1984 ඔක්තෝම්බර් මාසයේ චිනයේ ෂැන්ග්හායි නුවර පැවති ආසියානු කාන්තා පැසිපන්දු කණ්ඩායමට ලංකාව

නියෝජනය කරන ලදි. ඇය 1986 වසරේදි කොළඹ විශ්වවිද්‍යාල කළා පීඨ මළල ක්‍රීඩා කණ්ඩායමේ නායකත්වය දරූ අතර පැසිපන්දු දල්පන්දු මේසපන්දු සහ හොකී වර්ණ දිනාගත් අතර 1987/1988 කොළඹ විශ්ව විද්‍යාල පැසිපන්දු කණ්ඩායමේ නායකත්වය ද 1990 වසරේ මේසපන්ද කණ්ඩායමේ නායකත්වයද දරණ ලදි. එමෙන්ම 1990 වසරේදි ජාතික පැසිපන්දු ශූරතාවය සඳහා සහභාගිවූ ඒකාබද්ධ විශ්වවිද්‍යාල කණ්ඩායමට නායකත්වය දෙමින් අනුශූරතාවය දිනා ගන්නා ලදි. එමෙන්ම 1987/88 වර්ෂ වල විශ්වවිද්‍යාල ඒකාබද්ධ ක්‍රීඩා සංගමයේද සාමාජිකාවකි.

1996 ශ්‍රී ලංකා විදේශසේවයට ඇතුලත්ව තම සේවා කාලය ඇතුලත විදේශකටයුතු අමාත්‍යංශයේ එක්සත් ජාතිනගේ අංශයේ නියෝජ්‍ය අධ්‍යක්‍ෂකවරියක වශයෙන් හා මැදපෙරදිග ශා කොන්සියුලර් අංශයේ කොන්සියුලර් වරියක් වශයෙන් සේවයකර ඇත. එම ලැබූ අත්දකීම් මත විගමනික ප්‍රජාව සම්බන්ධයෙන් කටයුතු කිරීමේ මනා පරිචයක් ලබාගෙන ඇත. එතුමිය තම සේවා කාලය තුල ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් හේග් - නෙදර්ලන්තය දෙවන ලේකම්, වියානා-ඔස්ට්‍රියා දෙවන ලේකම්, යැන්ගුන්-මියන්මාර් උපදේශක, අබුඩාබි-එක්සත් ආරාබි එමීර් රාජ්‍යය අමාත්‍ය උපදේශක, මැනිලා-පිලිපීනය වැඩබලන තානාපති හැටියට තානාපති සේවයේ යෙදී ඇත. ශ්‍රී ලංකාව නියෝජනය කරමින් විවිධ සම්මන්ත්‍රණ සහ සම්මේලනවලට සහභාගිවී ඇති එතුමිය නීතිඥ ඩී ඒ ඩී මෙන්ඩිස් මැතිතුමාගේ දයාබර බිරිඳ වන අතර බින්ධ්‍යා සහ බිමන්සා යන නිවුන් දියණියන්ගේ සෙනෙහෙබර මවයි.